(2) පහත සඳහන් රූපයේ දක්වා ඇති කෝණ හඳුනා ගෙන, දී ඇති වගුව සම්පූර්ණ කරන්න.

| කෝණය | කෝණ වර්ගය |
|---|---|
| a | |
| b | |
| c | |
| d | |

| කෝණය | කෝණ වර්ගය |
|---|---|
| e | |
| f | |
| g | |
| h | |




(3) කොටු කඩදාසියක පහත සඳහන් එක් එක් වර්ගයේ කෝණය බැගින් ඇඳ, කෝණයේ වර්ගය ඒ අසලින් ලියන්න.
සුළු කෝණයක්, සෘජු කෝණයක්, මහා කෝණයක්, සරල කෝණයක්, පරාවර්ත කෝණයක්.

## 9.2 කෝණයක ගතික හෝ ස්ථිතික හෝ ස්වභාවය

කෝණ පිළිබඳ ව තවදුරටත් විමසා බලමු.

පරිසරයේ ඇති බොහෝ දෑ නිරීක්ෂණය කිරීමෙන් කෝණ දැක ගත හැකි වේ. පහත දැක්වෙන්නේ ඒ සඳහා උදාහරණ කිහිපයකි.

පොතක පිට කවරයේ දාර අතර කෝණ



මුදුන් බිත්තියක මුදුනෙහි සෑදෙන කෝණය



කරත්ත රෝදයක ගරාදි අතර කෝණ

ඉහත දක්වා ඇති සෑම කෝණයක ම විශාලත්වය වෙනස් නොවන ලක්ෂණයෙන් යුක්ත වේ.

- මෙසේ කෝණයක විශාලත්වය ස්ථිර අගයක් ඇති බව කෝණයක **ස්ථිතික ස්වභාවය** යි.
- මේ අනුව ඉහත රූපවල දක්වා ඇත්තේ **ස්ථිතික ස්වභාවයක් ඇති කෝණ** වේ.
- කරත්ත රෝදය කැරකෙන විට දී පවා ගරාදි දෙකක් අතර කෝණයේ අගය වෙනස් නොවේ.

දැන් අපි යමක් භ්‍රමණය වන අවස්ථා කිහිපයක් සලකා බලමු.

| | | |
|---|---|---|
|  සවස 4ට සහ 4.15ට ඔරලෝසු කටු දෙක අතර කෝණ රූපයේ දක්වා ඇත. ඔරලෝසුවක පැය හා මිනිත්තු කටු දෙක අතර කෝණයේ විශාලත්වය වේලාවත් සමඟ වෙනස් වේ. |  කතුරකින් යමක් කැපීමේ දී කතුරේ අඬු අතර කෝණයේ අගය වෙනස් වේ. | දොරක් අරින හෝ වසන හෝ අවස්ථාවේ දී දොරේ උඩ දාරය සහ උළුවස්සේ උඩ දාරය අතර කෝණයේ අගය වෙනස් වේ. |

ඉහත දැක්වෙන අවස්ථා තුනේ දී ම අදාළ කෝණය සෑදෙන බාහු දෙකෙන් එකක් හෝ දෙක ම හෝ කැරකීමෙන් (භ්‍රමණය වීමෙන්) බාහු දෙක අතර කෝණයේ විශාලත්වය වෙනස් වේ. මෙය කෝණයක **ගතික ස්වභාවය** යි.

කෝණයක ගතික ස්වභාවය පහත ක්‍රියාකාරකමෙහි යෙදීමෙන් තව දුරටත් අවබෝධ කර ගනිමු.

## ක්‍රියාකාරකම 1

**පියවර 1** - අමු පොල් ඉරටුවක් ගෙන, එය කැඩී වෙන් නොවන පරිදි මැදින් දෙකට නවන්න.

**පියවර 2** - එම ඉරටු කොටස් දෙක එක මත එක සිටින සේ මේසයක් මත තබා, පළමු කොටස මේසයට තද කර අල්ලා ගන්න.

**පියවර 3** - දෙවන කොටස මේසය මත කැරකැවීමෙන් ලැබෙන අවස්ථා කිහිපයක රූප සටහන් පොතේ අඳින්න.

එසේ ලැබිය හැකි අවස්ථා කිහිපයක රූප සටහන් පහත දැක්වේ.






නොමිලේ බෙදා හැරීම සඳහා ය.

- ඉරටු කැබැල්ලේ පළමු කොටස සහ දෙවන කොටස අතර කෝණයේ විශාලත්වය වෙනස් වන බව ඔබට නිරීක්ෂණය කළ හැකි ය. එනම්, මෙහි දී කෝණයට ගතික ස්වභාවයක් ඇත.
- ඉරටු කොටස් දෙක ම භ්‍රමණය කළ විට ද ඉරටු කොටස් දෙක අතර කෝණයේ විශාලත්වය වෙනස් වේ.

යම් භ්‍රමණයක් ඔරලෝසුවේ කටු යන අතට සිදු වන විට එය **දක්ෂිණාවර්ත භ්‍රමණයක්** ලෙසත් එයට විරුද්ධ දෙසට භ්‍රමණය වන විට **වාමාවර්ත භ්‍රමණයක්** ලෙසත් හඳුන්වනු ලැබේ.

**9.1 අභ්‍යාසය**

(1) (i) පරිසරයේ දී, ගතික ස්වභාවයක් ඇති කෝණ නිරීක්ෂණය කළ හැකි අවස්ථා 3ක් ලියන්න.

(ii) පරිසරයේ දී, ස්ථිතික ස්වභාවයක් ඇති කෝණ නිරීක්ෂණය කළ හැකි දේවල් 3ක් ලියන්න.

(2) (i) බාහු දෙකේ පිහිටීම ස්ථාවර ව පවතින ස්ථිතික ස්වභාවයක් ඇති කෝණ සඳහා උදාහරණයක් ලියන්න.

(ii) බාහු දෙකේ පිහිටීම ස්ථාවර ව නොපවතින ස්ථිතික ස්වභාවයක් ඇති කෝණ සඳහා උදාහරණයක් ලියන්න.

(iii) බාහු දෙකෙන් එකක පිහිටීම ස්ථාවර නොවන ගතික ස්වභාවයක් ඇති කෝණයක් සඳහා උදාහරණයක් ලියන්න.

(iv) බාහු දෙකේ ම පිහිටීම ස්ථාවර නොවන ගතික ස්වභාවයක් ඇති කෝණයක් සඳහා උදාහරණයක් ලියන්න.

## 9.3 කෝණ නම් කිරීම

දැන් අපි කෝණයක් නම් කරන ආකාරය විමසා බලමු.




- රූපයේ දැක්වෙන පරිදි $AB$ හා $BC$ සරල රේඛා ඛණ්ඩ දෙක හමු වීමෙන් කෝණ දෙකක් සෑදී ඇත.
- $AB$ හා $BC$ සරල රේඛා ඛණ්ඩ දෙක එක් එක් කෝණයේ "**බාහු**" ලෙසත්, $AB$ හා $BC$ සරල රේඛා ඛණ්ඩ දෙක හමු වන $B$ ලක්ෂ්‍යය "**ශීර්ෂය**" ලෙසත් නම් කරනු ලැබේ.